# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2054/9 - 2018 ජනවාරි මස 15 වැනි සඳුදා - 2018.01.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.24/1951(xiv).

### (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 215අ වන වගන්තිය සමග කියවිය යුතු 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2018 ජනවාරි මස 15 වැනි දින,
කොළඹ දී ය.

### නියෝගය

1. මෙම නියෝග 2018 අංක 01 දරන ස්ථානීය දඩ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ පනත සඳහා වන දෙවන උපලේඛනයේ II වන තීරයේ ඇති අදාළ විධිවිධාන වලට අදාළව I වන තීරයේ දක්වා ඇති වරදක් පිළිබඳව පොලිස් නිලධරයකු සොයා ගැනීමක් කළ විට සහ එම වරද සඳහා වූ වගකීම එම තැනැත්තා විසින් පිළිගනු ලැබූ විට, ඒ තැනැත්තා එකී වරදට නඩු පැවරීමට ලක්වීම වෙනුවට පනතේ අදාළ වගන්තියේ දක්වා ඇති විධිවිධාන පරිදි පහත සඳහන් උපලේඛනයේ III වැනි තීරයේ එම වරද සඳහා නියම කර ඇති ස්ථානීය දඩය ගෙවීමට එකඟ විය හැක.

### උපලේඛනය

(215අ වන වගන්තිය)

| | *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|---|
| | *පනතේ වගන්තිය* | *විධිවිධානය* | *ස්ථානීය දඩ මුදල රු. ශත* |
| 1. | 21, 22, 23, 24, 24(අ) වන වගන්ති | හඳුනාගනීමේ තහඩු | 1000.00 |
| 2. | 38 වන වගන්තිය | මෝටර් වාහන මත ආදායම් බලපත්‍රය ප්‍රදර්ශනය කළ යුතු අතර, නියම කරනු ලැබූ විට ඉදිරිපත් කළ යුතු බව | 1000.00 |
| 3. | 45 වන වගන්තිය | ආදායම් බලපත්‍රයේ විධිවිධාන උල්ලංඝනය කරමින් මෝටර් වාහනයක් භාවිත කිරීම තහනම් බව | 1000.00 |


1A - PG 3887 — 507 (2018/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

(215අ වන වගන්තිය)

| | I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|---|
| | පනතේ වගන්තිය | විධිවිධානය | ස්ථානීය දඩ මුදල රු. ශත |
| 4. | 128අ වන වගන්තිය | හදිසි සේවා වාහනයක් සහ පොදු සේවා වාහනයක් පැදවීමට නිසි අනුමතයක් ලබාගැනීමට අසමත් වීම | 1000.00 |
| 5. | 128ආ වන වගන්තිය | බලපත්‍රයක් නොමැතිව විශේෂ කාර්ය වාහනයක් පැදවීම | 1000.00 |
| 6. | 128ඇ වන වගන්තිය | රසායනික ද්‍රව්‍ය, උපද්‍රවකාරී අපද්‍රව්‍ය ආදිය පැටවූ වාහනයක් පැදවීම සඳහා අනුමතය ලබා ගැනීමට අපොහොසත් වීම | 1000.00 |
| 7. | 130 වන වගන්තිය | නිශ්චිත පන්තියකට අයත් වාහනයක් පැදවීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අපොහොසත් වීම | 1000.00 |
| 8. | 135 වන වගන්තිය | ධාවනය කරන විට රියදුරු බලපත්‍රය රැගෙන යාමට අසමත් වීම | 1000.00 |
| 9. | 139 අ වන වගන්තිය | උපදේශක බලපත්‍රයක් නොමැතිව උපදේශක කටයුතු වල නිරතවීම | 2000.00 |
| 10. | 140 සහ 141 වන වගන්ති | වේග සීමා විධිවිධානවලට අනනුකූලව ධාවනය කිරීම | 3000.00 |
| 11. | 148 වන වගන්තිය | මාර්ග රීතිවලට අවනත නොවීම | 2000.00 |
| 12. | 152 වන වගන්තිය | මෝටර් රථය පාලනය කරගැනීමට බාධාවක් නොවන සේ ධාවනය කිරීම | 1000.00 |
| 13. | 153 වන වගන්තිය | වාහනය පැදවීමේ දී සහ අනෙකුත් අවස්ථාවන්හි දී නුසුදුසු සංඥා භාවිත කිරීම | 1000.00 |
| 14. | 154 වන වගන්තිය | මෝටර් වාහනයක් මාර්ගයක පසුපසට දිගු දුරක් ධාවනය තහනම් කිරීම | 1000.00 |
| 15. | 155 වන වගන්තිය | අනතුරු ඇඟවීමේ උපකරණ අනිසි ලෙස භාවිත කිරීම | 1000.00 |
| 16. | 155අ වන වගන්තිය | දුම් ආදිය අධික විමෝචනය | 1000.00 |
| 17. | 156 වන වගන්තිය | මෝටර් වාහන පා පුවරුව යනාදියේ ගමන් කිරීම හෝ ගමන් කිරීම සඳහා ඉඩ දීම තහනම් බව | 500.00 |
| 18. | 157 වන වගන්තිය | මෝටර් වාහනවල ඉදිරිපස අසුන්වල සිටිය හැකි තැනැත්තන් සංඛ්‍යාවේ සීමාවන් | 1000.00 |
| 19. | 157අ වන වගන්තිය | ආසන පටි භාවිත නොකිරීම | 1000.00 |
| 20. | 158 වන වගන්තිය | ධාවනය කරන විට ආරක්ෂිත හිස්වැසුම් පැළඳීම පැහැර හැරීම | 1000.00 |
| 21. | 159 වන වගන්තිය | ධාවනය වෙමින් පවතින මෝටර් වාහනයකින් දැන්වීම බෙදාහැරීම තහනම් කිරීම | 1000.00 |
| 22. | 160 වන වගන්තිය | වාහනයකින් අධික ශබ්දය නිකුත් කිරීම තහනම් කිරීම | 1000.00 |
| 23. | 162 වන වගන්තිය | පොලිස් නිලධාරීන් ආදීන්ගේ විධාන සහ සංඥාවලට අවනත වීම පැහැර හැරීම | 2000.00 |
| 24. | 164 වන වගන්තිය | මාර්ග සංඥාවලට අවනත නොවීම | 1000.00 |
| 25. | 165 වන වගන්තිය | ටැංකියට ඉන්ධන දැමීමේ දී ගත යුතු පූර්ව ආරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීමට අසමත් වීම | 1000.00 |
| 26. | 166 වන වගන්තිය | මාර්ගයක මෝටර් වාහන නැවැත්වීම හෝ ගාල් කර තැබීම නොකිරීම | 1000.00 |
| 27. | 167 වන වගන්තිය | මාර්ගයක මෝටර් වාහනයක් නවතා තැබීමේ දී හෝ එය ළඟ නොසිටීමේ දී හෝ අක්‍රියවීමක දී ගතයුතු පූර්ව ආරක්ෂණ ක්‍රියාමාර්ග | 2000.00 |

උපලේඛනය (සම්බන්ධිතයි)

(215අ වන වගන්තිය)

| | I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|---|
| | පනතේ වගන්තිය | විධිවිධානය | ස්ථානීය දඩ මුදල<br>රු. ශත |
| 28. | 178 වන වගන්තිය | මෝටර් වාහනවල සහ පෞද්ගලික කෝච් රථවල පෞද්ගලික ගමන් බඩු හැර, ගෙන යා හැකි අනුමත තැනැත්තන් හෝ මගීන් ප්‍රමාණය ඉක්මවා ගෙනයාම සහ පෞද්ගලික ගමන්බඩු හැර මෝටර් වාහනවල හෝ පෞද්ගලික කෝච් රථවල ගෙන යා හැකි අනුමත බඩු ප්‍රමාණය ඉක්මවා ගෙන යාම | 500.00 |
| 29. | 179 වන වගන්තිය | බස් රථවල පෞද්ගලික ගමන් මළු හැර අනුමත ප්‍රමාණය ඉක්මවා තැනැත්තන් හෝ මගීන් ගෙනයාම සහ භාණ්ඩ ගෙනයාම | 500.00 |
| 30. | 188 වන වගන්තිය | උපරිම බර හෝ ඇක්සල් බර ඉක්මවා ලොරි රථවල හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථවල භාණ්ඩ ගෙනයාම | 500.00 |
| 31. | 189 වන වගන්තිය | ලොරි රථයක ගෙනයා හැකි තැනැත්තන් ප්‍රමාණය නොඉක්ම විය යුතු ය | 500.00 |
| 32. | 190 වන වගන්තිය | නියමයන් උල්ලංඝනය කිරීම | 1000.00 |
| 33. | 196 වන වගන්තිය | විමෝචන සහතිකය හෝ යෝග්‍යතා සහතිකය වාහනයේ තබා ගැනීමට අසමත් වීම | 500.00 |

03. 2017 අංක 18 දරන මෝටර් වාහන (සංශෝධන) පනතේ 22 වන වගන්තිය මගින් අවසන් වරට සංශෝධිත (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ දෙවන උපලේඛනයේ III වන තීරයේ නිශ්චිතව දක්වා ඇති දඩ මුදල්, මෙම නියෝගය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට පරිච්ඡින්න විය යුතු ය.

02 - 33

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.